USAID
FROM THE AMERICAN PEOPLE

# තිරසාර සැපයුම් දාමයක් ස්ථාපිත කිරීමට ඔබට කළ හැකි දේ

**1** භාණ්ඩ මිලදී ගැනීමේදී, ප්‍රතිචක්‍රීකරණය කළ හෝ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය හෝ තිරසාරව නිෂ්පාදනය කරන ලද භාණ්ඩ මිලදී ගන්න උනන්දු වන්න

**2** ආනයනය කළ භාණ්ඩ වෙනුවට හැකි සැමවිට ම දේශීය භාණ්ඩ තෝරා ගන්න. ඔබට හැකි සැමවිට ම සේවා සැපයීම සඳහා දේශීය සමාගම් වෙත යොමු වන්න

**3** හැකි සැමවිට ම අවම ඇසුරුම් සහිත නිෂ්පාදන තෝරා ගන්න. අමතර ඇසුරුම් අඩු කිරීමට, නැවත භාවිතා කිරීමට හෝ ඉවත් කිරීමට ඔබේ සැපයුම්කරුවන්ගෙන් ඉල්ලා සිටින්න

**4** ඔබට හැකි සැමවිට ම රසායනික ද්‍රව්‍ය වෙනුවට පරිසර හිතකාමී විකල්ප තෝරා ගන්න

**5** ප්ලාස්ටික් බීම බට (Straws), ප්ලාස්ටික් වතුර බෝතල් සහ වෙනත් තනි භාවිත ප්ලාස්ටික් භාවිතයෙන් ඉවත් කිරීමෙන් හරිත ලෝකයක් සඳහා ඔබේ කාර්යභාරය ඉටු කරන්න. ඔබේ සැපයුම්කරුවන්ද මේ සඳහා දිරිමත් කරන්න

**6** සංචාරකයින්, ඔබේම ගෙවත්තේ වගා කළ හෝ ඔබ ආසන්නයේ ඇති ගොවිපොළකින් මිලදී ගත් එළවළු භාවිතා කර පිස ගන්නා ආහාර වේලක් රසවිදීමට කැමති වනු ඇත. මේ සඳහා ඔබේ ගෙවත්තේ එළවළු වගාවක් අරම්භ කිරීමට හො ඔබේ ව්‍යාපාරය ආසන්නයේ ඇති ගොවිපොළක් සමග සම්බන්ධ වීමේ වැඩපිළිවෙලක් ආරම්භ කරන්න



ඩෙලොයිට් සමාගම මගින් කරන ලද සමීක්ෂණයකට අනුව ව්‍යාපාරිකයන්ගෙන් 46% ක් තම සැපයුම් දාමයට සම්බන්ධ ව්‍යාපාරික හවුල්කරුවන්හට නිශ්චිත තිරසාර නිර්ණායක සපුරාලීම අවශ්‍ය බව දන්වා ඇත.

පාරිභෝගිකයන්ගෙන් 88% ක් සමාජ හෝ පාරිසරික ගැටළු වලට සහාය දක්වන සමාගම් තොරා ගැනීමට ප්‍රවනතාවක් දක්වයි.

තිරසාර සැපයුම් දාමයන් සහිත සමාගම්, සමස්ත සැපයුම් දාම පිරිවැයෙහි 20%ක අඩුවීමක් අත්දකින අතර එම සමාගම් වල වෙළඳ සන්නාම කීර්තිය ද 15%කින් ඉහළ යන බව පෙන්නුම් කරයි. මෙමගින් පාරිභෝගික ලැදියාව සහ සමාගමට අයත් වෙළඳපොළ කොටසෙහි ඉහල නැංවීමක් සිදුවේ.